**මධ්‍යම පරිසර අධිකාරිය**

**පරිසර නිලධාරී (MA 5-1, Grade III) තනතුර සඳහා බඳවා ගැනීමේ තරඟ විභාගය**

මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර නිලධාරී (MA 5-1, Grade III) තනතුර සඳහා බඳවා ගැනීමේ තරඟ විභාගයට අදාළව 2025.05.15 වන දින සහ 2025.10.19 යන දිනයන්හිදී "Sunday Observer" පුවත්පතේ පළ කරන ලද දැන්වීම් වලට අනුව පරිසර නිලධාරි තනතුර සඳහා අයදුම්පත් යොමු කළ අයදුම්කරුවන්ගේ අවධානය පිණිසයි.

මෙම තනතුර සඳහා වන ලිඛිත තරඟ විභාගය **2026 මාර්තු මස 08 වන දින** පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.

**අයදුම්පත් ප්‍රතික්ෂේප වීම:** නියමිත පරිදි අයදුම්පත් යොමු නොකර, ගූගල් පෝරමය (Google Form) පමණක් පුරවා ඉදිරිපත් කර ඇති අයදුම්පත් හෝ රු. 1,000/-ක විභාග ගාස්තුව ගෙවා ඇති බවට නිසි සාක්ෂි (රිසිට්පත්) ඉදිරිපත් නොකළ අයදුම්පත් සහ නියමිත දිනට පෙර විභාග ගාස්තු නොගෙවූ අයදුම්පත් කිසිදු අයුරකින් සලකා බලනු නොලැබේ.

**සුදුසුකම් සපුරා නොමැති වීම:** යම් අයදුම්කරුවෙකු මෙම තරඟ විභාගය සමත් වුවද, බඳවා ගැනීමේ නිවේදනයේ සඳහන් කර ඇති මූලික සුදුසුකම් සපුරා නොමැති බව පසුව අනාවරණය වුවහොත්, ඔහු / ඇය සම්මුඛ පරීක්ෂණයට කැඳවීමකින් තොරවම නුසුදුස්සකු ලෙස සැලකීමේ පූර්ණ බලය මධ්‍යම පරිසර අධිකාරිය සතු වේ.

**සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම:** පවතින පුරප්පාඩු සංඛ්‍යාව මත පදනම්ව, ලිඛිත විභාගයෙන් **ඉහළම ලකුණු ලබා ගන්නා** අයදුම්කරුවන් පමණක් සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

**අවසන් තීරණය:** මෙම බඳවා ගැනීමේ ක්‍රියාවලියට අදාළව මීට පෙර දැනුම් දී ඇති කොන්දේසි වලට අමතරව ඇති වන ගැටළුවකදී අවසන් තීරණ ගැනීමේ බලය මධ්‍යම පරිසර අධිකාරියේ **අධ්‍යක්ෂ ජනරාල්වරයා** සතු වේ.

**ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම:** ඉහත සඳහන් දෝෂවලින් තොර, සුදුසුකම් ලබන අයදුම්කරුවන් සඳහා පමණක් ප්‍රවේශ පත්‍රය ශ්‍රී ලංකා පදනම විසින් තැපැල් මඟින් හා ප්‍රවේශ පත්‍රය බාගත කිරීමේ සබැඳිය (Link) සහිත කෙටි පණිවිඩයක් (SMS) හෝ විද්‍යුත් ලිපියක් මඟින් ලැබීමට සලස්වනු ඇත.

විභාගය සඳහා පෙනී සිටීමේදී ප්‍රවේශ පත්‍රය සමඟ ඔබගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත, වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

**විමසීම්:** 2026 මාර්තු මස 03 වන දින වන විටත්, ප්‍රවේශ පත්‍රය හෝ ප්‍රවේශ පත්‍රය බාගත කිරීමේ සබැඳිය (Link) සහිත කෙටි පණිවිඩය (SMS) හෝ විද්‍යුත් ලිපිය යන ඒවායින් එකක් හෝ නොලැබුන හෝ එමඟින් ප්‍රවේශ පත්‍රය බාගත කර ගැනීම සිදු කළ නොහැකි වූ අයදුම්කරුවකු වේ නම්, පෙ.ව. 09.00 - ප.ව. 04.00ත් අතර කාලය තුළදී පමණක් දුරකථන අංක 0112 – 124600 (දිගු අංක **2056, 2053, 2055, 2054, 2058, 2051**) ඔස්සේ හෝ careers@cea.lk යන විද්‍යුත් ලිපිනය වෙතින් විමසීමට කටයුතු කරන්න.

**අධ්‍යක්ෂ ජනරාල්**
මධ්‍යම පරිසර අධිකාරිය
2026.02.22